


"නාලනී එන්න මල් පිපී දැයි බලන්න"
"සාමා සහ අමර සල් මල් කඩනවා"
"අම්මේ අන්න මාමා එනවා"

කුඩා කළ සියට එලෙස කියවීමට හුරුවීම ඉතා හොඳ දෙයක් බවට කිසිදු විවාදයක් නොමැත. නමුත් ඒ ඇබ්බැහි වීමේ යම් අනිසි ප්‍රතිපල ද ඇති බව මට නොබෝ කලෙකින් වැටහිණි.

එයට හේතුව නම් මා පුවත්පත් කියවන විට ඒවා දෙඇසට ඉතා ලංකරන බව තාත්තා ගේ ඇස ගැටීමයි.

"මාත් දැක්කා ලොකු පුතා හැම තිස්සේම පත්තරේ මූණේ ඇලවෙන තරමට ලං කරලා තමයි කියවන්නේ!" අම්මා ද තාත්තාගේ නිරීක්ෂණය තවත් තහවුරු කළාය.
මේ කාලය වෙන විට මගේ පියා හතලිස් ඇඳිරිය ලබා කණ්ණාඩි පලඳින්ට පටන් ගෙන බොහෝ කල් ගොස්ය. ඇත්ත වශයෙන්ම තාත්තා ගේ ප්‍රශ්නය වූයේ පනස් ඇඳිරියයි.
"මං මෙයාව මේ සෙනසුරාදාම සිරිවර්ධන එකට එක්කරගෙන යනවා ඇස් බලවලා කණ්ණාඩි දෙකක් අරං දෙන්න" තාත්තා කීවේය.

# කණ්ණාඩි පොළඟා

වැනි දශක කිහිපයකට පසුවත් මතකයේ රැඳී ඇති වැකි අඩංගු වූවද, සමස්තයක් වශයෙන් බැලු කල, පළමුවෙනි ශ්‍රේණියේ සිංහල කියවීමේ පොත ඉතා නීරස එකක් වූ බව මගේ මතයයි. පස් වසරක දරු-වෙකු ගේ කුතුහලය අවුස්සන, කියවීමේ හෝ ලිවීමේ උනන්දුව නිසි පරිදි ඇතිකරවන වැඩි දෙයක් එහි අඩංගු වූවා යැයි මම නොසිතමි.

මා "කුමර දිවිය" ගත කළ ඒ කාලයේ අද මෙන් ළමා කියවීමේ පොත් සුලබව නොතිබුණි. ගම්බද කණිෂ්ඨ පාඨශාලා පරිසරයේ දී පුස්තකාලය යන්න කිසිදා අසා නොතිබුණු මහාප්‍රාණ පිරි අමාරු වචනයක් ම විය.




දෙවන තුන්වන ශ්‍රේණිවලදී මේ තත්වය තරමක් හෝ හොඳ අතට වෙනස් විණි.
ඩෙංකුටු, ඩෙංකුටු පෙරහැර එනවා කවි පන්තිය,

මෙන්න අපේ පූසී
ඉල්ලනවා දෝසී
උගට ටිකක් වීසි
කරන්න කෝ සීසී
එහෙම දෝසි වීසී
කරන්නේ නෑ සීසී
ඕනෑ නම් දෝසී
දෙන්න ඕනෑ කාසී

යනාදී වශයෙන් කියවුණු දෝසි කවි, විලියම් ටෙල් ඔහු ගේ පුතා ගේ හිස මත තැබූ ඇපල් ගෙඩියකට දුන්නෙන් විදි වීර කතාව,

වැනි සිංහල පොතේ ආ පාඩම් අපේ කියවීමේ රුචිය වැඩි දියුණු කළේය. පෙර කී පරිදි ළමුන් සඳහා ලියවුණු අමතර කියවීමේ පොත් නොතිබුණු ඒ කාලයේ ඒ අඩුව පිරවුනේ ලේක් හවුසියෙ-න් පල කළ "මිහිර" ළමා පත්තරයෙනි.

මා දෙවෙනි ශ්‍රේණියේ සිටියදීම වාගේ මගේ පියා මා වෙනුවෙන් මිහිර ළමා පත්තරය මිළට ගන්නට පටන් ගත්තේය.

මිහිර පත්තරයට මුහුදු වෙරළ ගැන කවියක් ලියා මා තුන්වෙනි ශ්‍රේණියේ දී ම කවියෙකු බවට පත්වූ හැටි ගැන කතාව මා මින් පෙර "කුමර දිවිය" තීරුවේ සඳහන් කළෙමි.
මිහිර ළමා පත්තරයට අමතරව සිළුමිණ පත්තරයේ ළමා පිටුවද, එහි පලවූ බන්දුල හරිශ්චන්ද්‍රගේ චිත්‍රකතාව ද මා ඉතා ආශාවෙන් කියවූවෙමි.

කණ්ණාඩි සාප්පුවේ දී කරණ ලද විවිධ අක්ෂි පරීක්ෂාවන් ගැණ මගේ මතකයේ වැඩි විස්තරයක් නැතත් එහි අවසාන ප්‍රතිපලය ලෙස සතියකට පසුව මට කුඩා කණ්ණාඩි දෙකක සාඩම්බර හිමිකරුවා වීමට මට ඉඩ ලැබුණි.
මගේ උපැස් යුවල දුම්මල පැහැ ගත් ප්ලාස්ටික් රාමුවකින් ද, ඕවාලාකාර වීදුරු කැබලි දෙකකින් ද සමන්විත විය. එය පාසලේදී ද, පොත්පත් කියවන වේලාවේදී ද නිතිපතා පාවිච්චි කළ යුතු යැයි මට උපදෙස් ලැබුණි.

තුන්වන ශ්‍රේණියේ දෙවන වාරයේ පමණ එක් සඳුදාවක මා පාසල් ගියේ කොණ්ඩය පීරන්නට පහසුවෙන පරිදි ගෑ පොල් තෙල් බිඳු කාන්දුවෙන නළලට මදක් යටින් දෙඇස වැසෙන සේ පැළඳි මගේ දුම්මල පාට කණ්ණාඩි කුට්ටමෙන් සැරසීගෙන ය.

අපේ පන්තියේ පමණක් නොව, අපේ මුලු ප්‍රාථමික පාසලේම සිටි කණ්ණාඩි දැමූ එකම සිසුවා මා වී යැයි සිතමි. ඉදින් එදිනම කණ්ණාඩි පොළඟා යනුවෙන් වූ සුරතල් නමක් අපේ පන්තියේ සිටි කවුදෝ මදාවි කොල්ලෙක් මට පට බැඳීම එතරම් පුදුමයක් නොවේ.

ඒ කණ්ණාඩි පොළඟා යන අන්වර්ථ නාමයේ සුරතල් බව කොතරම් ද යත්, මා ඒ කණ්ණාඩි යුවල පැළඳ පසල් ගියේ එකම එක සතියක් පමණි.

ඉනික්බිතිව තවත් වසර දහතුනක් යනතෙක්ම මගේ කණ්ණාඩි පැළඳීම ගැන මගේ පියාටත් මටත් අමතකව ගියේය.

මම ද මිහිර ළමා පත්තරයෙන්, සිළුමිණ පත්තරේ ළමා විශේෂාංගයෙන්, චිත්‍රකතාවෙන් ඔබ්බට ගොස් නවකතා කියවන්නට පටන් ගත්තෙමි.

මා එලෙස මුලින්ම කියවූයේ ගුණදාස ලියනගේ ලියූ මුළු හදින් මම ඇයට පෙම්කොට නමැති නවකතාවයි.

එතෙක් මිහිර ළමා පත්තරය කියවූ කණ්ණාඩි පොළඟා ඒ පිම්මත් සමගම මිහිරෙන් මිහිරට පත් වූයේය.

ශුවචන පිටෙන්

පුළුවන්ද කියන්න මම දන්නේ නෑ. නමුත් කවද හරි දෙන්න ඕනේ එක මුලින්ම දීලා දැම්මා නම් ඔය චෝදනාවලට ලක්වෙන්නේ නෑ. මගෙත් එක්ක පොත් ගැහුව එකම ලේඛකයෙක්වත් මගෙත් එක්ක තරහාවෙලා ගිහිල්ලා නෑ. මම සල්ලි දීලා නෑ කියලා කියන්න බෑ.

**ඔබගේ ව්‍යාපාරික ක්ෂේත්‍රය වර්තමානයේ මුහුණ දෙන අභියෝග මොනවාද?.**
මට නම් පේන්න කිසිම අභියෝගයක් නෑ. පොත් විකිනෙන්නේ නෑ කියලා කියනවා නම් ඒක බොරු. පොත් හුඟාක් ගහනවාට වඩා එක හොඳ පොතක් හරි කරනවා නම් ඒක විකුණගන්න පුළුවන්. ප්‍රකාශකයා ඒ තත්ත්වය ගොඩනගා ගන්න ඕනේ. මම මේ අහංකාරකමකට කියනවා නෙවෙයි. පාඨකයන්ගේ විශ්වාසයක් තියනවා කර්තෘ කවුරු වුණත් ප්‍රකාශකයා දයාවංශ ජයකොඩි නම් ඒක හොඳ පොතක් කියලා. ඒ නිසාම මට ආධුනිකයන්ගේ පොත් පළකරන්නත් පුළුවන්කම ලැබුණා. දැන් අපි නවකතා අත්පිටපත් තරඟයක් පවත්වනවා. අත්පිටපත් සීයක් විතර ලැබෙනවා. ඒකේ හොඳම පොත තෝරනවා. ඒ පොතට තෑග්ගක් වශයෙන් රුපියල් පනස්දාහක් දීලා කර්තෘ භාගයත් දීලා ඒක අපි පළකරනවා. ඒකෙන් මේ වෙනකොට අලුතෙන් ලේඛකයෝ හතර පස්දෙනෙක් ඇතිවුණා. මොකද මට තවත් අලුතෙන් ජයසේන ජයකොඩිලා ඕනේ. කුමාර කරුණාරත්නලත් ඕනේ. ජයකොඩි සෙනෙවිරත්නලත් ඕනේ.

**මෙතෙක් ආ ගමනේ මොනවගේ ඇගයීම්, ගරු සම්මානවලටද ඔබ පාත්‍රවෙලා තියෙන්නේ?**
මට ලැබිලා තියන ඉහළම සම්මානය තමයි මහජන-යාගෙන් ලැබිලා තියන සම්මානය. ආචාර්ය, මහාචාර්ය, කලාසූරි, ජේ.පී, ජේ.වී.පී. ඔය මොකුත්ම නෑ. මම නිකන්ම නිකං දයාවංශ ජයකොඩි. ජනාධිපති ප්‍රේමදාස මහත්තයා දේශබන්ධු සම්මාන දෙන්න ලෑස්තිකරපු මුල්ම ලැයිස්තුවේ ධර්මප්‍රිය පලන්සූරිය මහත්තයයි මමයි දෙන්නත් හිටියා. අපි දෙන්නම ඒක ප්‍රතික්ශේප කළා. මම ඒවගේ දේවල්වලට ආශා නෑ. මම කැමති මහජන සම්මා-නයට. මේ ළඟදී අපනයන සංවර්ධන මණ්ඩලයෙන් කතා කරලා කියනවා ඔබතුමාගේ සේවය බොහොම අගය කරනවා. අපි ඉල්ලුම් පත්‍රයක් එවනවා ඒක පුරවලා එවන්න සම්මානයක් දෙන්න කියලා. තමන්ට සම්මානයක් දෙන්න කියලා ඉල්ලලා අස්සන් කරලා ෆෝම් එකක් එවන්නලු. මොන ලැජ්ජ නැති වැඩක්ද ඒක. මම කිව්වා මට නම් ඒක කරන්න බෑ. නමුත් ඔබතුමාලට මගේ සේවය හොඳයි කියලා හිතිලා සම්මානයක් දෙනවා නම් ඒක ඔබතුමාලගේ වැඩක්. මම ඒක නොසලකා හරින්නේ නෑ කියලා. පහුගිය ස්වර්ණ පුස්ථක සම්මාන උළෙලේදී ශ්‍රී ලංකා පොත් ප්‍රකාශකයන්ගේ සංගමය මට සම්මානයක් දුන්නා. ඒක ඒගොල්ලන්ගේ හැඟීමෙන් එන එකක් නිසා මම ඒක බොහොම ගෞරවයෙන් පිළිගත්තා.

**සන්නස පාඨකයන් කැමතිවෙයි ඔබගේ පෞද්ගලික ජීවිතයේ තොරතුරු ටිකකුත් දැනගන්න?**

මගේ බිරිය වෙරෝනිකා දමයන්ති ජයකොඩි. එයා විශාකා විද්‍යාලයේ ඉගෙන ගත්තේ. මම ආනන්ද විද්‍යාලයේ ඉගෙන ගත්තේ. ප්‍රේම සම්බන්ධයකින් අපි දෙන්නා විවාහ වුණා. මගේ පුතා උදිත ධමින්ද ජයකොඩි ඉංජිනේරුවරයෙක්. දැන් ඇමරිකාවේ සේවය කරනවා. දුව කාංචනා සවන්ති ගුණසේන. පරිගණක ඉංජිනේරුවරියක්. විවාහ වෙලා එයත් ඇමරිකාවේ සේවය කරනවා. අපි හැමෝම බොහෙ-ාම සාර්ථක ජීවිත ගතකරනවා. දැනට තියන එකම එක ප්‍රශ්ණේ මම අවුරුදු පනහක් තිස්සේ ගොඩනගපු මේ ව්‍යාපාරය ගෙනියන්න දුව හරි පුතා හරි මෙහෙ නැති එක. ඒ දෙන්නගෙන් එක්කෙනෙක් ඇවිත් මේක බාරගනියි කියලා මම බලාගෙන ඉන්නවා.

සංවාදය සහ ඡායාරූප
ශ්‍රීලාල් සෙනෙවිරත්න

